# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

# ඇබෑර්තු

2021 අගෝස්තු මස 15 වන දින පළ කරන ලද සිළුමිණ, Sunday Observer, Thinakaran පුවත්පත් දැන්වීම් හා බැඳේ.

ඒ අනුව, **වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී** උසස් ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම සිදු නොවන බවද මෙයින් දන්වනු කැමැත්තෙමි.

පහත සඳහන් පාඨමාලාවන් සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම පිණිස 2017/2018 උසස්පෙළ විභාගයට පෙනී සිට පහත සඳහන් අදාළ මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. විද්‍යුත් බන්තු රේඛන ශිල්පී**

**02. විකිරණ ශිල්පී**

## අවශ්‍ය සුදුසුකම් :

## 01. විද්‍යුත් බන්තු රේඛන ශිල්පී

සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

හා

ජීව විද්‍යා විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව රසායන විද්‍යාව, යන විෂයන් 2 කද ඇතුලුව විෂයන් තුනම (03) අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී එක්වර සමත්ව සිටීම.

## 02. විකිරණ ශිල්පී

සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත්වී තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙ) විභාගයෙන් භෞතික විද්‍යා විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂිවිද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් 2 ක් එකවර සමත්වීම.

## පොදු කොන්දේසි

(01) වයස් සීමාව අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 25 ට නොවැඩි විය යුතුය.

(02) සුදුසුකම් ලබන දිනට විශ්වවිද්‍යාලයක හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

(03) සියලු අයදුම්කරුවන් විභාගයට පෙනී සිටි වර්ෂයේ අදාළ Z අගය සඳහන් කළ යුතුය.

(04) අයදුම්කරුවන් මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින්ද විශිෂ්ට චරිතයකින්ද යුක්ත විය යුතුය.

(05) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සනාථ කිරීම සඳහා අයදුම්පත්‍රය සමග සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(06) තෝරා ගන්නා අයදුම්කරුවන් පූර්ණකාලීනව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුහුණු පාසලේ පුහුණුව ලැබිය යුතු අතර, පුහුණුවීම් කාලය තුළදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V විධිවිධානවලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(07) සෑම අභ්‍යාසලාභියෙක්ම පුහුණු වීමෙන් පසු ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩලයේ අනිවාර්යය වසර 10 ක සේවා කාලයක් සේවය කරන බවට ගිවිසුමක් අත්සන් කළ යුතු වේ.

(08) පුහුණුවීමෙන් පසු බඳවා ගැනීම සිදු කරනුයේ තනතුරට අදාළ නීතිරීතිවලට යටත්ව වන අතර වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට යටත්ව පහත සඳහන් වැටුප් පරිමාණයන්ට අනුකූලවය.

**අංක 01 සඳහා**

රු. 42,105 - 10X600 - 11X890 - 10X985 - 10X1,015 - රු. 77,895/- (මාසිකව)

**අංක 02 සඳහා**

රු. 43,310 - 10X600 - 11X890 - 10X985 - 10X1,015 - රු. 79,100/- (මාසිකව)

ඉහත සුදුසුකම්ලත් අයදුම්කරුවන් නිසි පරිදි පුරවන ලද අයදුම්පත් 2021-10-13 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් සභාපතිතුමා වෙත යොමු කළ යුතු අතර, මෙම පාඨමාලාව සඳහා අභ්‍යාසලාභීන් තෝරා ගැනීමේ අවසාන තීරණය ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය සතුවේ.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල,**